ඒකාබද්ධ සේවා චක්‍රලේඛ : 01/2019

මගේ අංකය: PA/CS/POLICY/කා.ක.ඉම් විභාග IV
ඒකාබද්ධ සේවා අංශය
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
කොළඹ 07.

2019.04.10

අමාත්‍යාංශ ලේකම්වරුන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**සේවක අර්ථසාධක අරමුදල් ලිපිකාර සේවයේ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II පන්තියට/ ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා සහන කාලයක් ලබාදීම**

නියමිත පරිදි විභාග නොපැවැත්වීම හේතුවෙන් නියමිත දිනයන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීමට නොහැකි වූ රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන්ට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වීම සඳහා සහන සලසන ලද 2017.02.16 දිනැති ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 01/2017 කෙරෙහි අවධානය යොමු කරවමි. එය පූර්වාදර්ශ කරගනිමින් සේවක අර්ථසාධක අරමුදල් ලිපිකාර සේවයේ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියට/ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ නිලධාරීන්ට පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා සහන සලසාදීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර ඇත.

i. පූර්ව සේවක අර්ථසාධක අරමුදල් ලිපිකාර සේවයෙන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II වන පන්තියට/ශ්‍රේණියට අන්තර්ග්‍රහණය කරන ලද හා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වීමෙන් පසු එම සේවයේ 11 පන්තියට/ශ්‍රේණියට උසස්වීම්ලද නිලධාරීන්ට උසස්වීම් ලද දින සිට අනුයාත විභාග අවස්ථා 06 ක සහන කාලයක් ලබා දීම

ii. 2004.01.01 දිනට පෙර සේවක අර්ථසාධක අරමුදල් ලිපිකාර සේවයේ II 'අ' ඛණ්ඩයට උසස්ව, අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණකර නොමැති නිලධාරීන්ට 2004.01.01 දිනෙන් පසු අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කිරීම සඳහා අනුයාත විභාග අවස්ථා 06 ක සහන කාලයක් ලබාදීමට

iii. ඉහත පරිදි කාර්යක්ෂමතා කඩඉම් සහන ලබා දීමේදී සමස්ථ සේවයේ නිලධාරීන්ට ලබාදුන් සහන හා සමානුපාතික වන ලෙස සහන සලසා දිය යුතු හෙයින්, 2004.01.01 දිනට පෙර සේවක අර්ථ සාධක අරමුදල් ලිපිකාර සේවයට පත්ව එම සේවයේ II 'අ' පන්තියට උසස්ව, අදාළ කාර්යක්මතා කඩඉම් වැටුප් පියවරට 2004.01.01 දිනට පෙර එළඹී ඇති නිලධාරීන්ගේ 2004.01.01 දිනට පෙර සිදුවූ වැටුප් විලම්භන එලෙසින්ම තැබීමට කටයුතු කිරීමට

02. ඒ අනුව II වන පන්තියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්වීම / සම්පූර්ණ කිරීම ප්‍රමාදවීම හේතුවෙන්;

i. II වන ශ්‍රේණියට අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වීමට නොහැකි වීම මත වැටුප් වර්ධක විලම්භනය වූ නිලධාරීන් ද
ii. ඒ හේතුවෙන් සාමාන්‍ය කාර්ය සාධනය මත I වන ශ්‍රේණියේ උසස්වීම නියමිත කාලයට වඩා ප්‍රමාද වී ලැබී ඇති නිලධාරීන් ද
මේ යටතේ සිය විලම්භනය වූ වැටුප් වර්ධක සහ ඒ හේතුවෙන් ප්‍රමාද වූ සාමාන්‍ය කාර්ය සාධනය මත I වන ශ්‍රේණියේ උසස්වීම් (අංක 1372/23 හා 2004.12.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ 12.3 සහ අංක.1840/34 දරණ 2013.04.02 දිනැති එම සේවා ව්‍යවස්ථාවේ 10.2 වගන්තිවල සඳහන්) <u>පමණක්</u> යථාවත් කරගැනීම සඳහා දැනටමත් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ හෝ උසස්වීම් සඳහා හෝ සහන ඉල්ලා අභියාචනා ඉදිරිපත් කර නොමැති නිලධාරීන් ද සිය දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය ද සහිත ඉල්ලීමක් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

03. මෙය අතීතයට ද බලපාන පරිදි සිදුකරනු ලබන සහන සැලසීමක් වන හෙයින් ද අතීතයේදී අහිමි වූ අවස්ථා පිළිබඳව කිසියම් පිළියමක් වර්තමානයේ දී යෙදිය නොහැකි හෙයින් ද එවැනි කරුණුවලදී ගත් අතීත ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි කටයුතු කළ යුතු හෙයින් ද පහත දක්වා ඇති අහිමි වූ අවස්ථා පිළිබඳව ඉදිරිපත් කරනු ලබන අභියාචනා සලකා බැලීමට අවකාශ නොමැති බව අවධාරණය කරමි.

i. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භන හේතුවෙන් අහිමි වූ, වෙනත් සේවාවන්ට පිවිසීමට හෝ උසස්වීම් (අංක 1372/23 හා 2004.12.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය කළමනාකරණ සහකාර සේවා ව්‍යවස්ථාවේ හා අංක. 1840/34 2004.12.24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද සේවා ව්‍යවස්ථාවේ 12.2 වගන්තිය යටතේ සඳහන්) සඳහා වූ හෝ තරඟ විභාගයන්ට/සම්මුඛ පරීක්ෂණයන්ට හෝ එවැනි කිසියම් තෝරාගැනීමක් වෙනුවෙන් වූ අවස්ථාවක් සඳහා පෙනී සිටීමේ අවස්ථාවක් අහිමිවීම පිළිබඳව සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා.

ii. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනය හේතුවෙන් අහිමි වූ තනතුරු ලැබීමේ අවස්ථාවන් පිළිබඳ සහන ඉල්ලා ඉදිරිපත් කරන අභියාචනා.

iii. මෙම සහනය හිමිවීමට පෙර සිදුවූ වැටුප් වර්ධක විලම්භනයවීම් හඳුනා නොගෙන/නොසලකමින් සාවද්‍ය ලෙසින් උසස්වීම් හෝ වෙනයම් තරඟ විභාගයන්ට අයදුම්කර ඉන් සමත්ව සම්මුඛ පරීක්ෂණයේ දී හෝ වෙනයම් පසු අවස්ථාවක දී වැටුප් වර්ධක විලම්භනය හඳුනා ගැනීම හෝ සැලකීම හේතුවෙන් අදාළ උසස්වීම හෝ විභාගයේ ප්‍රතිඵල මත කෙරෙන පත්වීම හෝ වරප්‍රසාදය ලැබීම අත්හිටුවා ඇති නිලධාරීන් විසින් එම අත්හිටවූ පත්වීම්/වරප්‍රසාදය ලබාගැනීමට ඉදිරිපත් කරන අභියාචනා.

04. 2004.01.01 දිනට පෙර සේවක අර්ථ සාධක අරමුදල් ලිපිකාර සේවයට පත්ව එම සේවයේ II 'අ' ඛණ්ඩයට උසස්ව අදාළ කාර්යක්මතා කඩඉම් විභාගය 2004.01.01 දින දක්වා සමත්ව නොමැති නිලධාරීන්ට ද 2004.01.01 දිනෙන් පසුව මෙම චක්‍රලේඛය යටතේ අදාළ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සම්පූර්ණ කිරීමට අනුයාත විභාග අවස්ථා 06ක සහනයක් හිමිවන නමුත්, ඉහත 01(iii) යටතේ දක්වා ඇති පරිදි 2004.01.01 දිනට පෙර කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ නොකිරීම නිසා සිදුවී ඇති වැටුප් විලම්භනයක් වේ නම් එය එලෙසින්ම පවතින අතර, මෙමඟින් ඊට සහනයක් හිමි නොවනු ඇත.



කේ.වී.පී.එම්.ජේ. ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්